**කල්පිටිය ප්‍රාදේශීය සභාව**
**පුත්තලම දිස්ත්‍රික්කය**
**---------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන, 2015 මාර්තු 27 දින ද, ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2014 මැයි 30 දින ද, විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 අගෝස්තු 13 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

## 1.2 මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2014 දෙසැම්බර් 31 දිනට කල්පිටිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) කසල කළමනාකරණ මධ්‍යස්ථානයට මිළදී ගෙන තිබූ රු.225,000 ක් වටිනා කොම්පෝස්ට් පොහොර තලන යන්ත්‍රය ගිණුම්ගතකර නොතිබුණි.

(ආ) ඉදිරියට ගෙවා තිබූ රු.11,154 ක් ණයහිමියන් යටතේ ගිණුම් ගතකර නොතිබුණි.

(ඇ) අංක JB -2770 දරන වැපේ ට්‍රැක්ටර් රථයේ හා අංක LE-9727 දරන ලොරි රථයෙහි වටිනාකම් තක්සේරු කර ගිණුම් ගතකර නොතිබුණි.

(ඈ) ස්ථාවර වත්කම් ලේඛනයේ ඇතුළත් සභාව සතු ඉඩම් හා ගොඩනැගිලි ඒකක 23 ක වටිනාකම් තක්සේරු කර ගිණුම් ගතකර නොතිබුණි.

(ඉ) පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශය මඟින් ලැබිය යුතු ප්‍රාග්ධන ආධාර රු.5,000,000 ක් වැඩිපුර ගිණුම්ගත කිරීමෙන් ආදායම් ණයගැතියන් හා මූලධන ආධාර එම ප්‍රමාණයෙන් වැඩිපුර දක්වා තිබුණි.

**1.3.2 නොසැසඳූ පාලන ගිණුම්**

**-------------------------**

සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ මූල්‍ය ප්‍රකාශනවල වූ ගිණුම් විෂයයන් ශේෂයන්ගේ එකතුව රු.31,147,963 ක් වුවද ඒවාට අදාල උපලේඛන අනුව එම ශේෂයන්ගේ එකතුව රු.30,958,340 ක් වීම හේතුවෙන් රු.189,623 ක ශුද්ධ වෙනසක් නිරීක්ෂණය විය.

**1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

**---------------------------------**

2014 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම්වල වටිනාකම රු.45,184,022 ක් වූ අතර, එදිනට ගෙවිය යුතු ගිණුම්වල වටිනාකම රු. 40,714,817 ක් විය. එයින් වර්ෂයකට වඩා කාලයක සිට පැවත එන ලැබිය යුතු ගිණුම් ශේෂවල එකතුව රු.14,812,893 ක් වූ අතර, වර්ෂ 03 ක් ඉක්මවූ ගෙවිය යුතු ගිණුම් ශේෂවල එකතුව රු.19,403,405 ක් විය.

**1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම**

**---------------------------------**

ගිණුම් විෂයයන් 08 කට අදාලව එකතුව රු.85,930,400 ක්වූ වත්කම් හා වගකීම් සනාථ කිරීම සඳහා ප්‍රමාණවත් සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීම හේතුවෙන් ඒවා සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

**1.3.5 නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

**-------------------------------------------------**

නියැදි විගණන පරීක්ෂාවේ දී නිරීක්ෂණය වූ නීති,රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවූ අවස්ථා පහත දක්වා ඇත.

(අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 129 (2) (අ) සහ (ඊ) වගන්ති ප්‍රකාරව ප්‍රාදේශීය සභාවට ලැබිය යුතු සියළුම වරිපනම්, බදුකුලී, බලපත්‍ර ගාස්තු, උසාවි දඩ හා මුද්දර ගාස්තු රු.45,194,021 ක් විධිමත් පරිදි අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණු අතර පනතේ 134 වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවල එකම කලාපයක් සඳහා වරිපනම් බදු ප්‍රතිශත 2 ක් පැනවිය නොහැකි වුවද, සභාව විසින් එකම කලාපයේ පිහිටි නිවාස සඳහා සියයට 9 ක් හා ව්‍යාපාර ස්ථාන සඳහා සියයට 12 ක් බැගින් වරිපනම් බදු පනවා තිබුණි. එසේම පනතේ 150 (4) වගන්තිය ප්‍රකාරව සභා බලප්‍රදේශයේ ඇති ව්‍යාපාරික ස්ථානවලින් බලපත්‍ර ගාස්තු නොගෙවා පැහැර හරින තැනැත්තන් සම්බන්ධයෙන් අවශ්‍ය නීතිමය පියවර ගෙන නොතිබූ අතර පනතේ 158 වගන්තිය ප්‍රකාරව සභා බලප්‍රදේශයේ වරිපනම් හා අක්කර බදු නොගෙවා පැහැර හරින තැනැත්තන්ට අයත් වංචල දේපල තහනමට ගෙන හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සභාව සතු වත්කම් සෑම වර්ෂයක් අවසානයේදීම සමීක්ෂණයකර වාර්තා පිළියෙල කර නොතිබුණි.

(ඇ) සභාවේ තැන්පත් කර තිබූ වසර 2 ක් ඉක්මවන ලද රු.5,726,734 ක් වටිනා තැන්පතු 818ක් ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව ආදායමට ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) 1996 අංක 34 දරන භාණ්ඩ හා සේවා බදු පනතට අනුව වර්ෂ ගණනාවක සිට අයකර ගෙන තිබූ භාණ්ඩ හා සේවා බදු රු.289,387 ක් දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත නොයවා අත රඳවාගෙන තිබුණි.

(ඉ) 2002 අංක 14 දරන එකතු කල අගය මත බදු පනත අනුව 2010, 2011 සහ 2012 වර්ෂයෙහි 4 වන කාර්තුව හා 2013 වර්ෂයේ පළමු කාර්තුව සඳහා වූ එකතු කල අගය මත බදු වෙනුවෙන් රැස්කල රු.4,326,351 ක මුදලක් දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා වෙත නොයවා අත රඳවාගෙන තිබුණි.

(ඊ) 2009 අංක 09 දරන ජාතිය ගොඩනැඟීමේ බදු පනත ප්‍රකාරව 2011 වර්ෂයට පෙර හා 2012 හා 2013 වර්ෂවල රැස් කරන ලද ජාතිය ගොඩනැඟීමේ බදු මුදල් රු.53,221 ක් දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත නොයවා අත රඳවාගෙන තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශයන්ට අනුව, 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.8,991,395 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.1,006,144 ක් විය. සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය තුළ පිළිවෙලින් රු.48,484,620 ක් හා රු.4,226,054 ක් වූ මූලධන ආධාර සහ රු.43,995,821 ක් හා රු.13,456,424 ක් වූ මූලධන වියදම් ගණන් බැලීමෙන් පසු සමාලෝචිත වර්ෂයේ රු.13,480,194 ක අතිරික්තයක් ඇති වී තිබුණ අතර, පෙර වර්ෂයේ රු.8,224,226 ක ඌනතාවයක් ඇති වී තිබුණි. ඒ අනුව පෙර වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.21,704,420 ක වර්ධනයක් සිදුව තිබුණි.

2.2 ආදායම් පරිපාලනය

------------------------

2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය

-------------------------------------------

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම, තථ්‍ය ආදායම හා හිඟ ආදායම පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | 2014 ඇස්තමේන්තුගත | 2014 තථ්‍ය | 2014 දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය | 2013 ඇස්තමේන්තුගත | 2013 තථ්‍ය | 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|---|---|
| | රු. 000‘ | රු. 000‘ | රු. 000‘ | රු. 000‘ | රු. 000‘ | රු. 000‘ |
| වරිපනම් හා බදු | 2,765 | 2,728 | 8,159 | 2,910 | 335 | 6,216 |
| බදුකුලී | 7,032 | 5,189 | 8,760 | 5,515 | 4,000 | 9,111 |
| බලපත්‍ර ගාස්තු | 27,775 | 19,334 | 74 | 2,007 | 2,029 | 81 |
| වෙනත් ආදායම් | 3,362 | 1,877 | - | 16,560 | 10,288 | 7,472 |

**2.2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය**

**----------------------------------**

සමාලෝචිත වර්ෂයේ අයවැය ලේඛනයෙන් පුනරාවර්තන වියදම් සඳහා වෙන්කර තිබූ ප්‍රමාණයෙන් සියයට 32 ක් උපයෝජනය කරගෙන නොතිබූ අතර, රුපියල් මිලියන 101 ක මුළු ප්‍රාග්ධන වියදමින් උපයෝජනය කරගෙන තිබුණේ රුපියල් මිලියන 44 ක් හෙවත් සියයට 44 ක් පමණක් විය.

**2.2.3 වරිපනම් බදු**

**--------------**

2014 ජනවාරි 01 දිනට වරිපනම් බදු හිඟ මුදල් රු.6,216,006 ක් වූ අතර, සමාලෝචිත වර්ෂයේ බිල් කිරීම් රු.2,619,202 ක් වූයෙන් අයකරගත යුතු මුළු මුදල රු.8,835,208 ක් විය. ඉන් රු.1,557,475 ක් පමණ අයකර ගෙන තිබූ අතර, එය ප්‍රතිශතයක් වශයෙන් ගත්කල සියයට 18ක් විය. සමාලෝචිත වර්ෂය අවසානයට පැවති මුළු හිඟ මුදල රු.7,277,733 ක් විය.

**2.2.4 බදු කුලී**

**---------**

2014 ජනවාරි 01 දින හිඟ බදු කුලී මුදල රු.7,996,342 ක් වූ අතර, සමාලෝචිත වර්ෂයේ බිල්කිරීම් රු.5,101,870 ක් වූයෙන් අයකර ගත යුතු මුළු මුදල රු.13,098,212 ක් විය. ඉන් සමාලෝචිත වර්ෂය තුළ රු.4,337,794 ක් පමණක් අයකර ගෙන තිබුණු අතර එය ප්‍රතිශතයක් ලෙස ගත්කල සියයට 33 ක් විය.

**2.2.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

**----------------------------**

2014 දෙසැම්බර් 31 දිනට විවිධ ආඥා පනත් යටතේ මහේස්ත්‍රාත් අධිකරණයක් විසින් අයකර ප්‍රධාන ලේකම් වෙත යවා තිබූ රු.2,930,298 ක උසාවි දඩ මුදල් සභාවට අයවීමට තිබුණු අතර 2014 දෙසැම්බර් 31 දිනට පළාතේ ප්‍රධාන ලේකම්වරයා විසින් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගෙන් අයකර ගත් රු.12,960,860 ක මුද්දර ගාස්තු සභාවට අයවීමට තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**-------------------------**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

**--------------------------------**

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2014 දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව තිබූ සේවක ණය අත්තිකාරම් ශේෂවල එකතුව රු.4,719,189 ක් වූ අතර, එය තුල අවුරුදු 06 කට පෙර විශ්‍රාම ගිය හා සේවය හැර ගිය සේවකයින් 64 දෙනෙකුගෙන් අයවිය යුතු රු.141,361 ක් ද විය.

(ආ) ලේකම් තනතුර වසර කිහිපයක් තිස්සේ පුරප්පාඩුව පැවති අතර, ද්විතියික හා ප්‍රාථමික ශ්‍රේණිවල තනතුරු 29 ක පුරප්පාඩු පැවතුණි. ප්‍රාථමික ශ්‍රේණිවල තනතුරුවල රාජකාරි සඳහා 71 දෙනෙකු අනියම් හා තාවකාලික පදනමින් බඳවාගෙන තිබුණි.

(ඇ) 2014 දෙසැම්බර් 31 දිනට රු.397,124 ක අත්තිකාරම් පියවා නොතිබූ අතර, ඉන් වසර 02 ඉක්ම වූ අත්තිකාරම් වටිනාකම රු.278,696 ක් විය.

**3.2 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

**------------------------------------**

එකතුව රු. 1,469,515 ක් වටිනා වත්කම් විෂයයන් 04 ක් ද, වටිනාකම සොයාගත නොහැකි වූ වත්කම් විෂයයන් 03 ක් ද වර්ෂ ගණනාවක් තිස්සේ නිෂ්ක්‍රීයව හා ඌන උපයෝජිතව පැවතුණි.

3.3 අභ්‍යන්තර විගණනය

-------------------------

ප්‍රාදේශීය සභා රීතී (මුල්‍ය හා පරිපාලන) අංක 5(7) ප්‍රකාරව මුල්‍ය හා ගබඩා කටයුතු සම්බන්ධයෙන් ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් පවත්වා නොතිබුණි.

4. **පද්ධති හා පාලන**

**-------------------**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) වත්කම් කළමනාකරණය